ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

| | | |
|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | දිනය<br>திகதி<br>Date. 2025.07.21 |

ටී.බී. ශ්‍රියානි දිල්රුක්ෂි ප්‍රියදර්ශනී මිය
රත්නපාය,
තෙල්වත්ත.

**පැමිණිලිකාර පාර්ශවය**

අන්තොනි ගමගේ සමන්ත ප්‍රීතිකුමාර

**වින්දිත පාර්ශවය**

01. උ.පො.ප තිලංක මයා
පොලිස් මත්ද්‍රව්‍ය නාශක කාර්යාංශය,
කොළඹ 01.

02. පො.සැ 8824 බාලසූරිය මයා
පොලිස් මත්ද්‍රව්‍ය නාශක කාර්යාංශය,
කොළඹ 01.

03. පො.කො.රි 9000 කලුආරච්චි මයා
පොලිස් මත්ද්‍රව්‍ය නාශක කාර්යාංශය,
කොළඹ 01.

04. පො.කො 93682 අභිෂේක මයා
පොලිස් මත්ද්‍රව්‍ය නාශක කාර්යාංශය,
කොළඹ 01.

05. පො.කො 83808 විකුම් ආරියසිංහ මයා,
පොලිස් මත්ද්‍රව්‍ය නාශක කාර්යාංශය,
කොළඹ 01.

06. පො.කො 31996 හේරත් මයා,
පොලිස් මත්ද්‍රව්‍ය නාශක කාර්යාංශය,
කොළඹ 01.

07. පො.කො 924473 තිලින මධුෂාන් මයා,
පොලිස් මත්ද්‍රව්‍ය නාශක කාර්යාංශය,
කොළඹ 01.

08. පො.කො 61323 සංජීව සම්පත් මයා,
පොලිස් මත්ද්‍රව්‍ය නාශක කාර්යාංශය,
කොළඹ 01.

09. උ.පො.ප තිලෝක නුවන් මයා
පොලිස් මත්ද්‍රව්‍ය නාශක කාර්යාංශය,
කොළඹ 01.

වගඋත්තරකාර පාර්ශවය

**<u>පැමිණිලි අංකය: HRC/100/23</u>**

**<u>පැමිණිල්ල</u>**

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව, 1996 අංක 21 දරණ පනතේ 14 වන වගන්තිය ප්‍රකාරව ස්ව මෙහෙය වීමෙන් 2023.01.13 වන දින අන්තොනි ගමගේ සමන්ත ප්‍රීතිකුමාර යන අයවලුන් අත්අඩංගුවේ සිටියදී මරණයට පත්වීම පිළිබඳව විමර්ශනයක් ආරම්භ කරන ලදී. පසුව පැමිණිලිකාර පාර්ශවය 2023.01.12 දින ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පැමිණිල්ලක් ගොනුකරමින් දක්වනු ලබන්නේ ඇයගේ නිත්‍යානුකූල ස්වාමිපුරුෂයා වන අන්තොනි ගමගේ සමන්ත ප්‍රීතිකුමාර යන අය ශ්‍රී ලංකා වෘත්තිය පුහුණු අධිකාරියේ නාරාහේන්පිට ප්‍රධාන කාර්යාලයේ කළමණාකරණ සහායක ලෙස සේවය කළ බවත්, ඔහුව 2023.01.10 වන දින පොලිස් මත්ද්‍රව්‍ය නාශක කාර්යංශ නිලධාරීන් විසින් අසත්‍ය චෝදනා මත අත්අඩංගුවට ගෙන නීති විරෝධීව රඳවා තබා ගනිමින් කෲර ලෙස වධහිංසනයට ලක් කර මරණයට පත් කර ඇති බවත් ය.

**<u>පැමිණිලිකාරියගේ වැඩිදුර කරුණු දැක්වීම</u>**

තමාගේ ස්වාමිපුරුෂයා 2023 ජනවාරි මස 09 වන දින නිවසේ සිට ඔහු සේවය කළ ශ්‍රී ලංකා වෘත්තිය පුහුණු අධිකාරියේ නාරාහේන්පිට කාර්යාලයට පිටව ගිය බවත්, එදින රාත්‍රියේ ඔහු ගෙදර පැමිණියේ නැති බවත්, ඔහුට පසුදින එනම්, 2023.01.10 වන දින පෙ.ව 8.30 ට හා ප.ව 1.30 ට දුරකථනයෙන් තමා කතා කළ බවත්, ඒ අවස්ථාවන්හිදී ඔහු තමා සමඟ දුරකථනයෙන් කතා කළ නමුත්, ප.ව 3.30 ට කතා කළවිට ඊට ප්‍රතිචාර නොදැක්වීම නිසා තමා ඔහුගේ කාර්යාලයේ සේවය කරන නදීශානි මිය ගෙන් ඔහු පිළිබඳව විමසු බවත්, ඔහු සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ සිටින බවට දැන්වූ බැවින් පසුව තමා එදින රාත්‍රියේ නිවසට පැමිණ දුරකථන ඇමතුම් ලබාගත්තද, ඔහු ප්‍රතිචාර නොදැක්වූ බවත්, රාත්‍රී

9.00 ට පමණ ඔහුගේ නවාතැනේ මිතුරාට කතා කළ විට ඔහු ඒ පිළිබඳ සොයා බලා තොරතුරු දන්වන බව පැවසූ බවත් පැමිණිලිකාරිය විසින් ප්‍රකාශ කර ඇත.

පසුව රාත්‍රී 10.00 ට පමණ තමාහට දුරකථන ඇමතුමක් ලැබුණු බවත්, ශ්‍රී ලංකා වෘත්තිය පුහුණු අධිකාරියේ නාරාහේන්පිට කාර්යාලය ඉදිරිපිට කෑම කඩය අසලදී වෑන් රථයකින් තම ස්වාමිපුරුෂයා රැගෙන ගොස් ඇති බවට තමා දැනුම්වත් වූ බවත්, පසුව මේ කරුණු පිළිබඳව ශ්‍රී ලංකා වෘත්තිය පුහුණු අධිකාරියේ නාරාහේන්පිට කාර්යාලයේ විදුහල්පති විසින් නාරාහේන්පිට පොලිස් ස්ථානයට පැමිණිලි කිරීමට ගිය බවත්, තමාට අදාළ වසමේ පොලිස් ස්ථානයට පැමිණිලි කරන ලෙසට විදුහල්පතිවරයා විසින් දැන්වූ බැවින් 2023.01.10 වන දින රාත්‍රී 11.00ට පමණ මීටියාගොඩ පොලිස් ස්ථානයට CIB II/20/97 යටතේ මේ පිළිබඳව පැමිණිලි කළ බවත් පැමිණිලිකාරිය විසින් සඳහන් කර ඇත.

තම ස්වාමිපුරුෂයා රත්තරන් පැළඳ සිටින නිසා ඔහුව පැහැර ගැනීමට ලක්ව ඇතැයි සැකසිතූ බවත්, රාත්‍රී 2.00 ට පමණ මීටියාගොඩ පොලිස් ස්ථානයෙන් දුරකථන ඇමතුමක් ලබාදුන් බවත්, එම ඇමතුමෙන් ස්වාමි පුරුෂයා හට තුවාල වී රෝහලේ සිටින බවට දැනගැනීමට ලැබුණු බවත්, පසුව තමා හා පවුලේ අය කොළඹට ආ බවත්, එලෙස පැමිණි පසුව ඔහු මියගොස් ඇති බව තමා දැනගත් බවත්, ඔහු නීති විරෝධි මත්ද්‍රව්‍ය සමග අත්අඩංගුවට පත් වූ බවට කරුණු පළවූ නමුත්, නීති විරෝධි මත්ද්‍රව්‍ය සම්බන්ධව ඔහු කටයුතු කළ බවට කිසිදු කරුණක් මීට පෙර ඉදිරිපත්ව නොතිබූ බවත් වැඩිදුරටත් කරුණු දක්වමින් පැමිණිලිකාරිය විසින් ප්‍රකාශ කර ඇත.

<u>වගඋත්තරකාර පාර්ශවයේ කරුණු දැක්වීම</u>

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් පහත සඳහන් දිනවලදී වගඋත්තරකාර නිලධාරීන් කැඳවා ප්‍රකාශ සටහන් කර ගන්නා ලදී.

| | | | |
|---|---|---|---|
| 01. | පො.කො කසුන් සංජීව හේරත් | - | 2023.03.31 |
| 02. | පො.කො නදිෂ ලක්මාල් කලුආරච්චි | - | 2023.05.16 |
| 03. | උ.පො.ප නදුන් තිලංක | - | 2023.06.02 |
| 04. | පො.කො විකුම් ප්‍රදීප් කුමාර | - | 2023.06.02 |
| 05. | පො.කො අභිෂේක් පෙරේරා | - | 2023.09.05 |
| 06. | පො.සැ උදයන්ග බාලසූරිය | - | 2023.09.05 |
| 07. | පො.කො තිළිණ මධුෂාන් | - | 2023.09.05 |
| 08. | පො.කො සංජීව සම්පත් | - | 2023.09.05 |
| 09. | උ.පො.ප තිලෝක නුවන් | - | 2024.07.25 |
| 10. | ප්‍ර.පො.ප ලලිත් ජයසේකර | - | 2024.08.02 |
| 11. | ප්‍ර.පො.ප කේ. නිල්රොයි ජයරත්න | - | 2024.09.05 |

වගඋත්තරකාර පාර්ශවයන් කොමිෂන් සභාව හමුවේ විමර්ශන කටයුතු සඳහා කැඳවූ අවස්ථාවන්හිදී ප්‍රකාශ කරන ලද්දේ පුද්ගලික ඔත්තුකරුවකු විසින් ඔත්තුවක් ලබා දෙමින් පොඩි ලැසී නම් මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවෙකුගේ මත්ද්‍රව්‍ය ප්‍රවාහනය කරනු ලබන පුද්ගලයකු ලෙස සමන්ත ප්‍රීති කුමාර යන අය හඳුන්වා දුන් බවත්, ඒ අනුව ඔහු සේවය කරනු ලබන නාරාහේන්පිට වෘත්තිය පුහුණු ආයතනය අසල හෝටලයක් ඉදිරිපිටදී අත්අඩංගුවට ගත් බවත් ය. අත්අඩංගුවට ගත් සැකකරු පරීක්ෂා කිරීමේදී ඔහු සන්තකයේ තිබී හෙරොයින් මත්ද්‍රව්‍ය සහ මත්ද්‍රව්‍ය ජාවාරම් තුළින් උපයා ගන්නා ලද බවට සැක කරන රුපියල් එක් ලක්ෂ පනස්දාහක මුදලක් හමු වූ බවත් කොමිෂන් සභාව හමුවේ කරුණු දක්වමින් සඳහන් කරන ලදී.

පසුව තවදුරටත් මත්ද්‍රව්‍ය ජාවාරම් සම්බන්ධ තොරතුරු අනාවරණය කළ හැකි බව පවසමින් නිදහස් තැනකට රැගෙන යන ලෙස සැකකරු දැන්වූ බැවින් සැකකරුව නෙළුම් කුළුන අසල තම නිලධාරි බැරැක්කය පිටුපස ඇති ස්ථානයකට රැගෙන ගිය බවත්, එහිදී මත්ද්‍රව්‍ය ජාවාරම පිළිබඳ ප්‍රශ්න කරමින් සිටියදී සැකකරු බහිස්ශ්‍රාවිය කටයුත්තක් සඳහා යාමට අවශ්‍ය වූ බව දැන්වීම මත එක් අතක මාංචු නිදහස් කර උ.පො.ප. තිලංක, පො.කො. මධුෂාන්, පො.කො. සංජීව යන නිලධාරින් ඔහු ඒ සඳහා ගිය බවත්, එම බහිස්ශ්‍රාවිය කටයුත්තෙන් පසුව ඔහු එක්වරම ගලක් රැගෙන පො.කො. හේරත් නිලධාරියාට පහරක් එල්ල කළ බවත් වගඋත්තරකරුවන් විසින් දක්වා ඇත.

පසුව සැකකරු විසින් අසල තිබූ වීදුරු බෝතලයක් රැගෙන බිත්තියේ ගසා වීදුරු කැබැල්ලකින් පො. කො. බාලසූරිය මහතාට පහරක් එල්ල කළ බවත්, ඔහුට තුවාල සිදුවූ බවත්, ඒ හේතුවෙන් පසුව ආත්ම ආරක්ෂාව උදෙසා ලී කැබැල්ලකින් සැකකරුට පහරක් එල්ල කළ බවත්, එහිදි පහර එල්ල කළ පසු සැකකරු ඇද වැටී නැවත නැගිට බැරැක්කය අසල කෝච්චි පාර දිගේ ඉදිරියට දිව ගිය බවත් වැඩිදුරටත් දක්වා ඇත. එහිදි ඔහු පසු පසින් හඹාගිය නිලධාරින් ඔහුව පොර බැදීමකින් පසු අල්ලා, නැවත සිටි ස්ථානයට රැගෙන පැමිණි බවත්, එහිදී ඔහු සිහසුන්ව ඇද වැටුනු බවත් කොමිෂන් සභාව ඉදිරියේ කරුණු වාර්තා කරමින් දක්වා ඇත. ඉන්පසුව ක්ෂණිකවම කොළඹ ජාතික රෝහලට රැගෙන ගිය බවත්, එහිදී ඔහු මරණයට පත් ව ඇති බව දැන ගන්නට ලැබු බවත් කොමිෂන් සභාව ඉදිරියේ කරුණු දක්වන ලදී.

<u>විශ්ලේෂණය</u>

පැමිණිලිකාර පාර්ශවය කොමිෂන් සභාවේ පැමිණිලි කරමින් දක්වා සිටිනුයේ වගඋත්තරකාර පාර්ශවය විසින් වින්දිත පාර්ශවය නීති විරෝධි ලෙස අත්අඩංගුවට ගෙන කෲර වධහිංසාවට පත් කර අත්අඩංගුවේදි මිය යාමට කටයුතු කළ බවයි. තවද, මාධ්‍ය වෙත වැරදි කරුණු ඉදිරිපත් කිරිම තුළින් හා එම කරුණු මාධ්‍යයේ ප්‍රචාරය විම මත වින්දිතගේ බිරිඳ දරුවන් ඇතුලු අනිකුත් ඥාතින් ඒ තුළින් අවමන් සහගත සැලකුමකට ලක්වූ බවත් දක්වා ඇත.

## 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන ව්‍යවස්ථාව උල්ලංඝණය

අත්අඩංගුවට ගැනීම පිළිබඳ කරුණු විමර්ශනයේදි වගඋත්තරකාර පාර්ශවය මානව හිමිකම් කොමිෂන් සභාවට දන්වා සිටිනුයේ මත්ද්‍රව්‍ය නාශක කාර්යංශයේ උසාවි කටයුතු සිදුකරනු ලබන නිලධාරියෙකු වන උ.පො.ප. තිලෝක නුවන් වෙත 2023.01.09 දින 4.30 ට පමණ පෞද්ගලික ඔත්තුකරුවෙකුගෙන් ලද "VTA එකේ වැඩ කරන සමන්ත කියලා කෙනෙකු කුඩු බිස්නස් එකක් කරනවා ඒ පිළිබඳව දැනුම් දීමට යම් ස්ථානයට පැමිණෙන ලෙස" දැනුම් දුන් බවත්, ඒ අනුව එම ඔත්තුවට අනුව මෙම පැමිණිල්ලේ වින්දිත තැනැත්තා 2023.01.10 දින ප.ව. 2.00ට VTA අසලදී අත්අඩංගුවට ගත් බවත් ය. මෙහිදී වගඋත්තරකාර පාර්ශවයන් විසින් කොමිෂන් සභාව වෙත ලබා දී ඇති ප්‍රකාශ සැලකීමේදී මෙම අත්අඩංගුවට ගැනීම සිදුකර ඇත්තේ පුද්ගලික ඔත්තුකරුවෙකුගෙන් ලද තොරතුරක් මත බව නිරීක්ෂණය වේ.

එසේ වුවද, එලෙස ලද තොරතුර සාධාරණ තොරතුරක්ද යන්න තහවුරු කර ගැනීමට වගඋත්තරකාර පාර්ශවය කටයුතු කර තිබේ ද යන්න පිළිබඳව අවධානය යොමු කිරීමේදී, එම තොරතුර හා විමර්ශනය පිළිබඳ විවිධ පරස්පර ප්‍රකාශ වගඋත්තරකාර පාර්ශවය කොමිෂන් සභාවේදි ලබාදී ඇති බව නිරීක්ෂණය වේ. එහිදී මෙම පුද්ගලික ඔත්තුව ලබාදුන් තැනැත්තා ඔත්තුව ලබාදුන් පසු ඒ පිළිබඳව එවකට ස්ථානාධිපතිව සිටි ප්‍ර.පො.ප. ලලිත් ජයසේකර මහතාට දැනුම් දුන් බවත්, ඒ අනුව එම වැටලීම සිදුකරන ලෙස තමාට අවසර ලබාදුන් බවත්, 2024.07.05 දින කොමිෂන් සභාව වෙත ලබා දුන් ප්‍රකාශයේදි 09 වන වගඋත්තරකරු විසින් දක්වා ඇත.

ඒ පිළිබඳව 2024.08.02 දින කොමිෂන් සභාව හමුවේ ප්‍රකාශ ලබා ගනිමින් ප්‍ර.පො.ප. ලලිත් ජයසේකර මහතා වෙතින් විමසීමේදි තමා හට එවැනි දැනුම්දීමක් නොකළ බවත්, එලෙස අවසර දීමක් තමා නොකළ බවත් දක්වා ඇත. එසේම, එහිදී ඔහු වැඩිදුරටත් දක්වා සිටින්නේ එවැනි තොරතුරක් ලද පසුව එම නිලධාරියා විසින් එම තොරතුරු වහාම දැනුම් දිය යුත්තේ අදාළ වැටලීම් අංශයේ ස්ථානාධිපතිට බවයි. තවදුරටත් ඒ පිළිබඳ අවසර පැතිය යුත්තේ ද වැටලීම් භාර නිලධාරියා බවත් දක්වා සිටියි.

තවද, එවකට මෙම වැටලීම් අංශයේ ස්ථානාධිපති වන ප්‍ර.පො.ප. නිල්රෝයි ජයරත්න මහතාගෙන් විමසීමේදී 2024.09.05 වන දිනැතිව කොමිෂන් සභාවට ලබාදුන් ප්‍රකාශයේදි දක්වා ඇත්තේ තමාට එවැනි වැටලීමක් සිදුකරන බවට දැනුවත් කිරීමක් නොකළ බවයි. ඒ අනුව ස්ථානාධිපති හෝ වැටලීම් අංශයේ ස්ථානාධිපති මේ පිළිබඳ දැනුවත් වී සිට නොමැති බව කොමිෂන් සභාවට නිරීක්ෂණය වේ.

එසේම, 09 වන වගඋත්තරකරු කොමිෂන් සභාව වෙත ප්‍රකාශ කර ඇත්තේ "තමාට කණ්ඩායමක් නොමැති බැවින් උ.පො.ප. තිලංක හා තමා එකම උ.පො.ප. කණ්ඩායමේ බැවින් ඔහුට තොරතුරු ලබාදී වැටලීමට සහාය වු බවයි.

ඒ අනුව තොරතුරක් ලද පසු ඒ පිළිබඳ සිදුවිය යුතු සාමාන්‍ය ක්‍රමවේදය වන වැටලීම් අංශයේ ස්ථානාධිපති දැනුවත් කර ස්ථානාධිපති විසින් අනුමත කරන කණ්ඩායම සමග ඒ සඳහා යොමුවීම මෙම සිදුවීමට අදාළව සිදුවී නොමැති බව ද නිරීක්ෂණය වේ.

තවද මෙම පුද්ගලික ඔත්තුකරුගෙන් ලැබුණු තොරතුර පිළිබඳව යම් පරස්පර ප්‍රකාශ වගඋත්තරකාර නිලධාරීන් විසින් කොමිෂන් සභාව හමුවේ ලබාදුන් ප්‍රකාශ වලදී දක්වා ඇත.

"නාරාහේන්පිට VTA එකේ වැඩකරන සමන්ත කියලා කෙනෙක් කුඩු බිස්නස් එකක් කරනවා. එයාව අල්ලගන්න. ඉන්න තැන මම කියන්නම්. හැටේ වත්තට ඇවිල්ලා හම්බවෙලා වැඩිදුර විස්තර කතා කරමු" යැයි පුද්ගලික ඔත්තුකරු පැවසූ බව 09 වන වගඋත්තරකරු දක්වා ඇත. 09 වන වගඋත්තරකරු විසින් වැඩිදුරටත් දක්වා සිටිනුයේ පුද්ගලික ඔත්තුකරු හමු වූ විට "ඔත්තුකරු ප්‍රධාන ජාවාරම්කරුවෙකුගේ නමක් කිවුවා, එයා පොඩි ලැසිද කවුද කියලා මට මතක නැහැ. එයාගේ මත්ද්‍රව්‍ය තමයි සමන්ත විකුනන්නේ, VTA එකේ වැඩ කරන ගමන් මේ බිස්නස් එක කරන්නේ, සමන්ත කවුද කියලා පෙන්වන්නම් කියලා කිව්වා" ලෙස දක්වා ඇත. එසේම, "ඒ වේලාවේ ආවේක්ෂණ රාජකාරි කරමින් සිටියා. රෑ වෙනකල් එයා ආවේ නැහැ ඊට පස්සේ ඔත්තුකරු කිවුවා මේක අපි හෙට උදේ බලමු, දැන් යන්න කියලා" ලෙස වැඩිදුරටත් දක්වා ඇත.

වැටලීම් කණ්ඩායමේ නායක 01 වන වගඋත්තරකරු දක්වා සිටියේ ඔත්තුකරු හමුවූ විට "එයා කියන සමන්ත කියන්නේ VTA එකේ වැඩ කරන කෙනෙක්. එයා ලොකුවට බිස්නස් කරනවා කිවුවා. ලැසීගේ බඩු තමයි බිස්නස් කරන්නේ, ඒ වගේම ටික වේලාවකින් බෝගහ තියෙන හන්දියට සමන්ත බඩු අරගෙන එනවා කියලා. පසුව ඔහු සමන්ත හඳුනා ගැනිමට හැකි පරිදි සමන්ත ඇඳගෙන එන ඇඳුම පිළිබඳ දැනුම් දෙන්නම් යැයි පවසා ඔහු එතනින් පිටව ගියා" යනුවෙනි.

ඒ අනුව පුද්ගලික ඔත්තුකරු හමුවූ නිලධාරීන් දෙදෙනා වන ඉහත කී 1 වන සහ 9 වන වගඋත්තරකරුවන් විසින් මෙහිදී පරස්පර ප්‍රකාශ දෙකක් ලබා දී ඇති බව නිරීක්ෂණය වේ.

මෙහිදී ඉහත සඳහන් ඔත්තුකරු විසින් සමන්ත විසින් මත්ද්‍රව්‍ය විකුණූ බවට පැවසූ කරුණ මතම වගඋත්තරකාර පාර්ශවය විසින් වින්දිත පුද්ගලයා අත්අඩංගුවට ගෙන ඇති බවට කරුණු නිරීක්ෂණය වේ.

ඔත්තුකරු ලබාදුන් තොරතුර සාධාරණ තොරතුරක්ද යන්න නිශ්චය කර ගැනීමෙන් තොරව මෙම අත්අඩංගුවට ගැනීම කර ඇති බව තවදුරටත් කරුණු නිරීක්ෂණය වේ. මෙම වින්දිත තැනැත්තා සම්බන්ධව මීට පෙර කිසිදු අවස්ථාවක තොරතුරක් ලැබී නොතිබූ බව වගඋත්තරකාර පාර්ශවය ප්‍රකාශ කර ඇති බව ඔවුන්ගේ ප්‍රකාශ සැලකීමේදී නිරීක්ෂණය වේ.

එසේම, වගඋත්තරකරුවන්ගේ ප්‍රකාශ අනුව මෙම වින්දිත තැනැත්තා ඔහුගේ සේවා ස්ථානයෙන් පිටතට පැමිණි අවස්ථාවේදී අත්අඩංගුවට ගත් බව දක්වා සිටින අතර, අදාළ ආයතනය දැනුවත්

නොකළ බවද පිළිගෙන ඇත. ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියෙහි අධ්‍යක්ෂ (මානව සම්පත් හා පරිපාලන) වැ.බ. විසින් අංක HRD/15/03/CO/11 සහ 2025.06.27 දිනැති ලිපිය කොමිෂන් සභාව වෙත යොමු කරමින් සඳහන් කර ඇත්තේ වින්දිත පාර්ශවය වන අන්තෝනි ගමගේ සමන්ත ප්‍රීතිකුමාර යන අය 2023.01.10 වන දින පෙ.ව. 11.27ට සේවා ස්ථානය වෙත පැමිණි බවට ඇඟිලි සලකුණු යන්ත්‍රයේ සටහන් වී ඇති බවත්, පිට වූ වේලාව සටහන් වී නොමැති බවත් ය. ඒ අනුව මෙම වින්දිත තැනැත්තා 2023.01.10 වන දින ප.ව. 2ට ඔහුගේ සේවා ස්ථානයෙන් පිටතට පැමිණි අවස්ථාවේදී අත්අඩංගුවට ගත් බවට වගඋත්තරකරුවන් සිදු කර ඇති ප්‍රකාශ තහවුරු වේ.

තවද, පැමිණිලිකාර පාර්ශවයේ කරුණු දැක්වීමේදී තම ස්වාමිපුරුෂයා හට 2023.01.10 වන දින දුරකථනයෙන් ඇමතීමේදී කාර්යාලයේ සිටි බවත්, පසුව ප.ව. 3.00ට දුරකථනයට ඇමතීම් කළ ද ඊට ප්‍රතිචාර නොදැක්වූ බැවින් තමා ඔහුගේ කාර්යාලයේ නිලධාරිනියකගෙන් විමසීමේදී "ඔව් සමන්ත ඉන්ටර්විව් බෝඩ් එකේ ඉන්නවා" ලෙස කියූ බවත්, තමා දිගින් දිගටම ඔහු පිළිබඳ විමසීම් කළ ද ස්වාමිපුරුෂයා පිළිබඳ තොරතුරක් නොලද බවත්, පසු දින පෙ.ව 2.00 ට පමණ ඔහු රෝහල් ගත කර ඇති බව දැන ගන්නට ලැබුණු බවත් දක්වා ඇත. ඒ අනුව වින්දිත තැනැත්තාගේ ඥාතීන් හට මෙම වින්දිත තැනැත්තා පිළිබඳ කිසිදු තොරතුරක් ලබා දී නොතිබූ බැවින් ඔවුන් ඔහු පිළිබඳ සොයා බලා ඇති බවට කරුණු නිරීක්ෂණය වේ.

ඉහතින් සඳහන් කළ පරිදි පැමිණිලිකාරිය විසින් තම ස්වාමි පුරුෂයාගේ කාර්යාලයේ නිලධාරිනියකගෙන් විමසූ බවට සඳහන් කර ඇති බැවින් එලෙස විමසීම සිදු කර තිබූ නදීශානි හේරත් නම් නිලධාරිණිය 2025.06.02 වන දින දුරකථන ඇමතුමක් මගින් සම්බන්ධ කරගනිමින් මේ පිළිබඳව සිදු කළ විමසීමේ දී 2023.01.10 වන දින උදෑසන මෙම පැමිණිල්ලේ වින්දිත පාර්ශවය වන අන්තෝනි ගමගේ සමන්ත ප්‍රීතිකුමාර යන අය කාර්යාලය වෙත පැමිණි අවස්ථාවේ දී තමා හට මුණගැසුණු බවත්, ඉන්පසුව ඇය හට අන්තෝනි ගමගේ සමන්ත ප්‍රීතිකුමාර යන අය මුණනොගැසුණු බවත්, එදින සවස තුනට හෝ හතරට පමණ (වේලාව නිශ්චිතව මතකයේ නොමැති බව ප්‍රකාශ කරන ලදී) අන්තෝනි ගමගේ සමන්ත ප්‍රීතිකුමාර යන අයගේ බිරිඳ විසින් දුරකථන ඇමතුමක් ලබා දී අන්තෝනි ගමගේ සමන්ත ප්‍රීතිකුමාර යන අය පිළිබඳව විමසූ අවස්ථාවේ දී ඔහු කාර්යාලය තුළ සිටිනවා විය හැකි බවත්, නිශ්චිත පිළිතුරක් ලබා දීමට තමා නොදන්නා බවත් ඇය විසින් බිරිඳ හට පැවසූ බවත් වාචිකව ප්‍රකාශ කර ඇත. එකී කරුණු ඇතුළත් ලිඛිත දිවුරුම් ප්‍රකාශයක් කොමිෂන් සභාව වෙත ලබාදෙන ලෙස දැනුම් දුන්නද, තවදුරටත් මෙම සිදුවීමට සම්බන්ධ වීමට ඇය අපේක්ෂා නොකරන බැවින් දිවුරුම් ප්‍රකාශයක් ලබා දීම අපහසු බව ඇය දැනුම් දී ඇත.

කෙසේ වෙතත් මෙහිදී නිසි කාර්ය පටිපාටිය අනුගමනය කිරීමෙන් තොරව වගඋත්තරකාර පාර්ශවය විසින් වින්දිත තැනැත්තා අත්අඩංගුවට ගැනීම සිදු කර ඇති බවට නිරීක්ෂණය වේ.

## 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 වන ව්‍යවස්ථාව උල්ලංඝණය

මෙම වින්දිත තැනැත්තා අත්අඩංගුවේ සිටියදී වධහිංසාවට පත් කර මරණයට පත් කර ඇති බවට පැමිණිලිකාර පාර්ශවය විසින් කොමිෂන් සභාව හමුවේ කරුණු දක්වා ඇත.

වගඋත්තරකාර පාර්ශවයට අනුව මෙම තැනැත්තා අත්අඩංගුවට ගැනිමේදී බීමත්ව සිටි බවත්, පසුව අත්අඩංගුවේ සිටියදී පැනයාමට තැත්කළ බවත්, වගඋත්තරකාර නිලධාරීන් විසින් පොර බදා අත්අඩංගුවට ගත් බවත් දක්වා ඇත. මෙහිදී වගඋත්තරකාර පාර්ශවය විසින් කොමිෂන් සභාවට ඉදිරිපත් කර ඇති කරුණ වනුයේ වින්දිත තැනැත්තාගේ හැසිරීම අනුව අවශ්‍ය බලය යොදා අත්අඩංගුවට ගැනීම සිදුකළ බවයි.

මෙම පැමිණිල්ලේ වින්දිත පාර්ශවය මියගිය තැනැත්තෙකු වන බැවින් මෙම වධහිංසාව පිළිබඳ විමසිම සඳහා වූ ප්‍රබල විද්‍යාත්මක සාක්ෂියක් වූ එම තැනැත්තාගේ පශ්චාත් අධිකරණ වෛද්‍ය වාර්තාව කෙරෙහි අවධානය යොමු කිරිමේදී අධිකරණ වෛද්‍ය වාර්තාවේ තුවාල 49 ක් පහත පරිදි අධිකරණ වෛද්‍යවරයා විසින් දක්වා ඇත.

### හිසේ සහ මුහුණ

01. සීරිමක් සහිත තැල්මක් හිසේ පිටුපස ඉහල දකුණු පස
02. වම් ඇහි බැමට වාහාම ඉහලින් 3 x 3 cm ප්‍රදේශයක වූ තැල්ම කාන්ඩයක්
03. වම් ඇසට පාර්ශවීය හා වම් ඉහල කම්මුල දක්වා විහිදී ඇති සිරිමක් සහිත තැල්මක්
04. දකුණු අභ්‍යන්තර කක්ෂිය කලාපය තුළ 0.5 cm x 0.5 cmක තැල්මක්
05. දකුණු ඇසේ සංජාන රුධිර වහනයක්
06. දකුණු පස යටි හක්ක 0.5 cm x 0.5 cmක තැල්මක්
07. වම් පස යටි නිකට මත කොටස 2 x 2 cmක විහිදුනු මතු පිටින් වූ තැලීම් සමූහයක්
08. වම්පස උරහිසේ ඉදිරිපස ඉහල කොටසේ 2 x 1 cmක සීරිමක් සමඟ වූ තැල්මක්
09. පපුවේ පිටුපස වම්පස ඉහල කොටසේ 1 x 1 cmක සීරිමක්
10. තුවාල අංක 07 ට පහලින් පපුවේ පිටුපස වම් කොටසේ පිහිටා ඇති 2 cmක සිදුරු කරන ලද තුවාලයක්
11. වම් තට්ටමේ ඉහල කොටසේ 4 x 2 cmක් වූ සීරීම් තුවාලයක්
12. වම් තට්ටමේ බද කොටසේ 4 x 1 cmක් වූ සීරීම් තුවාලයක්
13. දකුණු තට්ටමේ ඉහළ කොටසේ 6 x 3 cmක තැලමක්
14. දකුණු තට්ටමේ මැද පාර්ශවීය කොටසේ 9 x 3 cmක තැල්මක්
15. දකුණු තට්ටමේ පහළ පාර්ශවීය කොටසේ 10 x 1 cm ට්‍රැම්ලයින් තැල්මක්

16. දකුණු තට්ටමේ පහල මැද කොටසේ වූ වක්‍රව හා සිරස්ව විහිදුනු 6 x 1 cmක ට්‍රැම්ලයින් තැල්මක්

17. දකුණු ඉදිරිපස පපුවේ පහල කොටසේ ඇති චර්මා අභ්‍යන්තර මාංශපේශීන් හි 5x3 cm තැල්මක් ඇති අතර 10 වන ඉල ඇටයේ දූරස්ථ කෙලවර කැඩී ඇත.

18. මැද උරහිස් කොඳු ඇට පෙල වටා පටක ලේ ගැලීම් දක්නට ලැබෙන අතර එය අන්තර් කොස්ටල් මාංශ පේශි දක්වා විහිදේ.

19. පහල පිටුපස සිට තට්ටම් දෙකටම සහ පිටුපස ඉහල කලවා දක්වා විසරණය වන චර්ම අභ්‍යන්තර පටක තැලීම් (මේද පටක හා මාංශ පේශි) මෘදු පටක වලට මධ්‍යස්ථ හෝ තද බල ලෙස වූ රුධිර වහනයක් සමඟ

ඉහත සඳහන් 17, 18 සහ 19 අභ්‍යන්තර තුවාල ඉහත දැක්වූ බාහිර තුවාල හේතුවෙන් සිදුවූ තුවාල වේ.

20. වම් අතෙහි ඉදිරිපස මැද සිරස් අතට පිහිටි රේඛීය සීරීම් 05ක්

21. වම් අතෙහි ඉහල බාහුවේ ඉදිරිපස නම්‍යශිලි මතුපිට 8 x 6 cm ප්‍රදේශයක සීරීම් සමූහයක්

22. 16 තුවාලයට වාහාම පහලින් වම් අතේ උඩ බාහුවේ නම්‍යශිලි මතුපිටේ පිහිටා ඇති 1x1 cmක සීරීම් තුවාලයක්

23. 17 තුවාලයට වාහාම පහලින් වම් අතේ උඩ බාහුවේ නම්‍යශිලි මතුපිටේ 2 x 1 cmක තැල්මක්

24. 18 වැනි තුවාලයට වහාම පහලින් වම් අතේ උඩබාහුවේ නම්‍යශිලි මතුපිට 1 x 1 cmක තැල්මක්

25. වම් උඩ බාහුවේ පිටුපස (විස්තාරක මතුපිට) (Extensor Surface) 1 x 1 cm තැල්මක්

26. වම් අත උඩ බාහුවේ පිටුපස (විස්තාරක මතුපිට) තුවාල අංක 20 ට වාහාම පහලින් 1x1 cmක තැල්මක්

27. වම් අත උඩ බාහුවේ පිටුපස (විස්තාරක මතුපිට) තුවාල අංක 21 ට වාහාම පහලින් 2 x 1 cmක තැල්මක්

28. වම් අතේ පෘෂ්ටීය අංශයේ 0.5 x 0.5 cm සීරිමක්

29. ඉහත තුවාල වලට අනුරූප වන චර්ම අභ්‍යන්තර පැල්ලම් සහිත තැල්මක් මෘදු ගණ තරමක පටක රුධිර වහනයක් ඇතුලත්ව ඇත.

30. වම් අතේ පත්ල කොටසේ විසිරි ඇති චර්ම අභ්‍යන්තර හා නැඹුරු මාංශ පේශි තැලීම් සමූහයක්

31. දකුණු ඉහල බාහුවේ අභ්‍යන්තර අංශයේ 2x 2 cm සිරිමක්

32. දකුණු ඉහල බාහුවේ පහළ ඉදිරිපස 3 x 3 cm තැල්මක්

33. දකුණු මැණික් කටුවේ පෘෂ්ටීය කොටසේ කුඩා තැලීම් සමූහයක්

34. දකුණු අතේ පෘෂ්ඨීය කොටසේ විසිරී ගිය චර්ම අභ්‍යන්තර තැලීම් සමූහයක්

35. දකුණු කලවා ප්‍රදේශයේ ඉහළ පාර්ශවීය කොටසේ සිට කලවා ඉදිරිපස දක්වා විහිදුණු 15x10 cm ඉක්මවූ සීරීම් සහ තැලීම් සහිත ට්‍රැම්ලයින් තැලීම් සමූහයක්

36. දකුණු කලවා ප්‍රදේශයේ පහල ඉදිරිපස කොටසෙහි 5 x 2 cm ක තැලීමක්

37. දකුණු කලවා ප්‍රදේශයේ පහල මැද කොටසට ඉහලින් 5 x 2 cm ක තැලීමක්

38. දකුණු දණහිසේ මැද කොටසෙහි තැලීම් සහ සීරීම් සමූහයක්

39. දකුණු කකුලේ ඉහල ඉදිරිපස තැලීමක්

40. දකුණු කකුලේ මැද ඉදිරිපස තැලීමක්

41. දකුණු කකුලේ පහල ඉදිරිපස තැලීමක්

42. දකුණු වලලුකරේ මැද කොටසේ තැලීමක්

43. වම් කලවයේ පිටුපස ඉහල කොටසේ තිරස් අතට තබා ඇති 10 x 1 cm ප්‍රමාණයේ ට්‍රැම්ලයින් තැලීමක්

44. වම් කලවයේ පිටුපස මැද කොටසෙහි තිරස් අතට 12 x 1 cm උසකින් යුත් ට්‍රැම්ලයින් තැලීමක්

45. වම් පහල කලවයේ පාර්ශ්විය පැත්තට ඉහලින් 6 x 4 cm රේඛීය සිරීම් සමූහයක්

46. විසරණයක්

47. වම් දණහිසේ මැද කොටසෙහි 5 x 2 cm ක තැලීමක්

48. වම් පාදයේ පහල ඉදිරිපස තැලීමක්

49. මෙම බාහිර තුවාල වලට අනුරූප මධ්‍යස්ථ රුධිර වහනයක් සහිත චර්ම අභ්‍යන්තර තැලීම් ඇත.

මරණයට හේතුව - රත්තපාත කම්පනය

මොට අයුධයකින් සිදු වූ බහු මෘදු පටක තුවාල

වෛද්‍යවරයාගේ මතය

01. මරණ පරික්ෂණයෙන් හෙලි වුයේ හිස, කද පිටුපස තට්ටමේ අත්පා මත පටක වලට මැද සිට දරුණු රුධිර වහනයක් සහිතව බහු මෘදු පටක තුවාල සහිත බව ය. මේ හේතුවෙන් ඇති වූ hypo- volemic shock මරණයට හේතු වී ඇති බව දක්වා ඇත.

02. තුවාල මොට ආයුධ වලින් සිදුවූ තුවාල බවත් සඳහන් කර ඇත.

03. තුවාල වල ආකාරය අනුව හිතාමතා සිදුකළ ප්‍රචණ්ඩත්වය පිළිඹිබු කරන අතර, අහඹු ස්වභාවය (Accidental nature) සහ තමා විසින් සිදුකර ගත් තුවාල යන්න බැහැර කළ හැකි බව දක්වා ඇත.

04. ස්වාභාවික රෝගී තත්ත්වයක් මරණය සඳහා හේතු වූ බවට සාක්ෂි නොමැති බවත් සඳහන් කර ඇත.

05. මරණයට පෙර ඇල්කොහොල් භාවිතය හෝ මත්ද්‍රව්‍ය සඳහා ඇබ්බැහි වූ බවට සාක්ෂි නැති බවත් දක්වා ඇත.

වගඋත්තරකරුවන් දක්වා සිටිනුයේ මෙම වැඩිදුර තොරතුරු දැනගැනීමට ගෙන ගිය අවස්ථාවේදි ඔහුගේ අත් මාංචුවෙන් මුදාහල විට නිලධාරීන්ට ගලකින් පහරදුන් බවත්, පසුව වීදුරු බෝතලයක් කඩා එයින් නිලධාරියෙකුට ගැසූ බවත්, පසුව ඔහු දිවයාමේදී නිලධාරීන් ඔහු පසු පස දුවගොස් පොර බදා අල්ලා ගත් බවත්ය.

ඒ අනුව, පොරබැදීම සිදු වූ පාර්ශවයන් සැලකීමේදී මෙම වින්දිත තැනැත්තාට බරපතල තුවාල 49 ක් ඇතිවීමටත් අනිකුත් නිලධාරීන් 08 දෙනාට ඊට සමානුපාතිකව කිසිදු තුවාලයක් ඇති නොවීමත් ප්‍රශ්න සහගත ය. එසේම අවම බලය යෙදීමක් සිදුවූවා නම් එය සමානුපාතික විය යුතු ය.

<u>කොරවගේ රංජිත් එ. රුක්මන් කුමාර ස්ථානාධිපති උරුබොක්ක හා තවත් අය</u> නඩුවේදි දක්වා සිටියේ "A Police officer should resort of the use of force only to achieve a legitimate objective associated with discharging their duties and in a manner that is prescribed by law. In the event that police officer is required to use such force, such force must strictly adhere to principles of necessity, reasonableness and proportionality where the use of force is lawfully required, all deployed police offers must make every effort within their capacity to avoid the loss of life and to minimize demise and injury to any person."

පුරුදු පුහුණු කළ නිලධාරීන් 08 දෙනෙකුට එක් පුද්ගලයකු මෙල්ල කර ගැනීමට හැකියාවක් නොතිබුණාද යන්න ප්‍රශ්නගත වේ. එවැනි බලයක් යෙදීමට සිදු වූ බවට දක්වන කරුණු පිළිගැනීමේ හැකියාවක් නොමැත. 01 වන වගඋත්තරකරුට අනුව මියගිය තැනැත්තා වීදුරු බෝතලයක් කඩා 04 වන වගඋත්තරකරුට එල්ල කළ බවත්, එම බෝතලය වනමින් දැගලූ බවත්, එහිදී 02 වන වගඋත්තරකරුට තුවාල වූ බවත්, පසුව තමා 04 වන වගඋත්තරකරුට එම කැඩුනු බෝතලය ඉවත් කිරීමට කියූවිට ඔහු පොලු කැල්ලක් ගෙන වින්දිත තැනැත්තාගේ අතට ගැසූ විට එම තැනැත්තා පිටුපසට වැටුණු බවත්, කැඩුණු බෝතලය ඉවතට විසිවූ බවත්, එහිදී තම නිලධාරීන් ඔහු සමඟ පෙරලි පෙරලි අසාමාන්‍ය ලෙස දැගලූ බවත් දක්වා ඇත. එහෙත් එලෙස පෙරලීම් සිදු කළ කිසිදු නිලධාරියෙකුට මෙවැනි ආකාරයේ හෝ කිසිදු තුවාල වීමක් සිදු වූ බවට කරුණු සනාථ කිරිමට වගඋත්තරකාර පාර්ශවය සමත්ව නැත.

ඒ අනුව විශේෂඥ අධිකරණ වෛද්‍යවරයාගේ මතය වන "තුවාල සිදුවූ ආකාරය අනුව එම තුවාල හිතාමතා සිදුකළ තුවාල වන බවට" දක්වන කරුණ තවදුරටත් සනාථ වේ.

මරණයට හේතුව ලෙස විශේෂඥ අධිකරණ වෛද්‍යවරයාගේ මතය වි ඇත්තේ මොට ආයුධයකින් වූ තුවාල, මෘදු පටක තුවාල හා රක්තපාත කම්පනයයි.

වගඋත්තරකාර පාර්ශවයේ ප්‍රකාශවලට අනුව අත්අඩංගුවට ගැනීමේදී වින්දිත තැනැත්තාගේ ශරීරයේ කිසිදු තුවාලයක් නොතිබුණු බවට කරුණු දක්වා ඇති අතර, මත්පැන් ගඳ වහනය වූ බව පමණක් දක්වා ඇත. එහෙත් පශ්චාත් මරණ පරීක්ෂණ වර්තාවට අනුව මරණයට පෙර මත්පැන් භාවිත කළ බවට හෝ මත්ද්‍රව්‍ය භාවිත කළ බවට සාක්ෂි සැපයිමක් නොකරන බව දක්වා ඇත. ඒ අනුව වගඋත්තරකාර පාර්ශවය හිතාමතාම මරණකරු මත්පැන් භාවිතා කළ බවට ව්‍යාජ කරුණු දැක්වීමක් කර ඇති බව අවධානයට ලක්වේ.

ඒ අනුව මෙම පැමිණිල්ලේ වින්දිත පොලිස් භාරයේ සිටියදී කෲර අමානුෂික වධහිංසාවට ලක්වූ බව නිගමනය කළ හැකි ය. 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 වන ව්‍යවස්ථාවෙන් සහතික ඇති වධහිංසාවෙන් මිදීමේ නිදහස පිළිබඳව ශ්‍රේෂ්ඨාධිකරණය මගින් මෑතකාලීනව නීති විද්‍යාව සංවර්ධනය කර ඇත.

මෑතකාලීනව ශ්‍රේෂ්ඨාධිකරණයේදී තීරණය වූ <u>අනුරාධා එ. මූලස්ථාන පොලිස් පරීක්ෂක අනුරාධපුර හා අනික් අය</u> (SCFR 369/2013) නඩුවේදී අවධාරණය කරන ලද්දේ,

" This is an unqualified no-derogate right and every person is entitled to it. This unqualified nature of the right and the fact that this provision is entrenched makes it abundantly clear that the constitution envisages zero tolerance towards cruel, inhuman or degrading treatment which is the anti-thesis of human dignity."

එසේම, මෙම නිරපේක්ෂ අයිතිවාසිකම සුරක්ෂිත කිරීම පිළිබඳ මීට වඩා වැඩි අවධානයක් දිය යුතු බව <u>ජාතුන් ගමගේ ප්‍රියන්ත එ. මූලස්ථාන පොලිස් පරීක්ෂක ඇඹිලිපිටිය හා තවත් අය</u> (SCFR 18/2016) නඩුවේදී විනිසුරු කෝදාගොඩ මැතිතුමා දක්වා ඇති අතර, තවදුරටත් දක්වා ඇත්තේ ශ්‍රී ලංකා පොලිස් නිලධාරීන් විසින් නැවත නැවත සිදුකරනු ලබන වධහිංසාවන් පිළිබඳ ශ්‍රේෂ්ඨාධිකරණයේ අවධානය යොමු වන බවත්, මෙම අශිෂ්ඨ හා නීතිවිරෝධී සංසිද්ධිය සැලකිය යුතු ලෙස අඩුවීමක් දක්නට නොලැබෙන බවත්, නඩු තීන්දුවක තීන්ත වියළීමට පෙර ඊට සමාන හෝ ඊට වඩා පහත් නඩුවක් අධිකරණයේ අවධානයට යොමු වන බවත් ය. තවද, නඩු තීන්දු තුලින් වින්දිත වෙත සහනය ලැබුණ ද 11 වන ව්‍යවස්ථාව මගින් සැලකිය යුතු තිරසාර ආරක්ෂාවක් මෙම රටේ ජනතාවට නොලැබී ඇති බව දක්නට ඇති අතර, (ඡේද 63-65) එහිදී ශ්‍රී ලංකා පොලීසියේ නායකත්වය හා ඊට පරිබාහිර නායකත්වය මේ සඳහා වගකිව යුතු බවත් දක්වා ඇත.

"Therefore the leadership and senior management of the Sri Lanka Police must take serious cognizant of this situation. The leadership would include not only the Inspector General of Police and Senior Deputy Inspector General of Police but also, the Minister to whom the Police has been assigned and the Secretary to the Ministry of the Minister in charge of the

subject as well. It is also necessary for the National Police Commission to take this matter in to serious considerations".

ශ්‍රියානි සිල්වා එ. ඉද්දමල්ගොඩ ස්ථානාධිපති පොලිස් ස්ථානය පයාගල හා තවත් අය නඩුවේදි මාක් ප්‍රනාන්දු විනිසුරුතුමා දක්වා සිටියේ ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13(4) ව්‍යවස්ථාව අනුව ජීවත්වීමේ අයිතිය, අධිකරණ නියෝගයකින් පමණක් අහිමි කළ හැකි කරුණක් වන බවත්, එම ව්‍යවස්ථාව අනුව දඬුවමක් මගින් හෝ වෙනත් ආකාරයකින් පුරවැසියෙකුගේ ජීවිතය අහිමි නොකිරීමට ඇති අයිතිය පිළිගන්නා බවත් ය.

එකී කරුණ ජයමුනි අනුරාධා නිල්මිනි විජේසේකර එ. පො.කො සුමේධ තුෂාර ඇතුලු තවත් අය (SC(FR) 449/2017) සහ මොහොමඩ් රාෂියා ෆාතිමා ෂර්මිලා එ. පොලිස් ස්ථානාධිපති කොම්පඤ්ඤවීදිය පොලිස් ස්ථානය සහ තවත් අය (SCFR 398/2008) නඩුවලදී ද තහවුරු කර ඇත.

ඒ අනුව මෙම පැමිණිල්ලට අදාළව පොලිස් භාරයේ සිටි පුද්ගලයකු වධහිංසාවට පත්කර මරණයට පත් කිරීම තුළින් පැමිණිල්ලේ වින්දිත තැනැත්තාගේ ජීවත් වීමට ඇති අයිතිය වගඋත්තරකාර පාර්ශවය විසින් අහිමි කර ඇති බවට කරුණු නිරීක්ෂණය වේ.

එසේම, 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III වන පරිච්ඡේදයේ 12(1) ව්‍යවස්ථාව ප්‍රකාරව සියලු තැනැත්තන් නීතිය ඉදිරියේ සමාන රැකවරණය ලැබීමට සුදුසුකම් ලබයි.

පොලිස් භාරයේ සිටින තැනැත්තන් ද නීතිය ඉදිරියේ සමාන රැකවරණය ලැබීමට සුදුසුකම් ලබයි. පොලිස් භාරයේ සිටින සැකකරුවන් සම්බන්ධව කටයුතු කළ යුතු ආකාරය පිළිබඳව පොලිස් නියෝග ඒ 20 තුළින් දක්වා ඇත. එහි පැහැදිලිව දක්වා ඇත්තේ සිරභාරයේ සිටින තැනැත්තෙකු වරදකරු කරනු ලබන සිරකරුවෙකුගේ තත්ත්වයේ සිටින්නෙකු නොවන බවත්, ආරක්ෂා භාරය ගැන සලකා ඔහු ගැන සෑම අතින්ම සැලකිලිමත් විය යුතු බවත්, සෑම පොලිස් නිලධාරියෙකුම ඒ පිළිබඳව මතක තබාගත යුතු බවත් ය.

පොලිස්පති චක්‍රලේඛ අංක 2328/2011හි පොලිස් අත්අඩංගුවේ පසුවන සැකකරුවන්ගේ ආරක්ෂාව සම්බන්ධයෙන් ක්‍රියාකළ යුතු ආකාරය දක්වා ඇත.

මෙම වින්දිත තැනැත්තා අත්අඩංගුවට ගැනීමෙන් පසු මත්ද්‍රව්‍ය ජාවාරම පිළිබඳ වැඩිදුර තොරතුරු ලබාදීමට නිදහස් ස්ථානයකට ගෙන යන ලෙස පැවසූ බවත්, ඒ අනුව නිලධාරීන්ගේ බැරැක්කය ආසන්නයේ වූ ආවරණය නොකළ ගොඩනැගිල්ලකට ගෙන ගිය බවත්, එහිදී ප්‍රශ්න කළ බවත්, වගඋත්තරකාර පාර්ශවය දක්වා සිටියි. ඒ අනුව අත් ඉදිරියට කර මාංචු දැමූ බවත්, පසුව ප්‍රශ්න කරමින් සිටියදී වැසිකිළියට යාමට අවශ්‍ය බව දැන්වූ පසු එක් අත් මාංචුවක් ගැලවූ බවත්, ඔහු වැසිකිළියට ගොස් එනවිට පහත්වී ගලක් ගෙන එක් නිලධාරියෙකුට ගැසූ බවත්, 01 වන වගඋත්තරකරු ප්‍රකාශ කර ඇති අතර, අනිකුත් වගඋත්තරකරුවන්ද එම කරුණුම ඒ ආකාරයෙන්ම දක්වා ඇත.

ඒ අනුව අත්අඩංගුවට ගත් පුද්ගලයෙකු ප්‍රශ්න කිරීම සඳහා පොලිස් ස්ථානයට ගෙන යාමෙන් තොරව වෙනත් ස්ථානයකට ගෙන ගිය බව වගඋත්තරකාර පාර්ශවය තම ප්‍රකාශ වලින් පිළිගෙන ඇත. එසේම, ඉහල නිලධාරින් වන ස්ථානාධිපති හා වැටලීම් භාර නිලධාරි අත්අඩංගුවට ගැනීම පිළිබඳ තමන්ට නොදැන්වූ බව ඔවුන් දෙදෙනා මානව හිමිකම් කොමිෂන් සභාවේදි ප්‍රකාශ කර ඇත. ඒ අනුව 2747/2023 පොලිස්පති චක්‍රලේඛනයේ 5.1, 5.6, 5.7 වගන්ති අනුව වගඋත්තරකාර පාර්ශවය ක්‍රියාකර නොමැති බවට කරුණු නිරීක්ෂණය වේ. තවද, වෙනත් ස්ථානයක රඳවා ප්‍රශ්න කිරිමට කටයුතු කිරීම තුළින්ද සැකකරුගේ අරක්ෂාව නිසියාකාරව සපයා නොමැති බව නිරීක්ෂණය වේ.

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් 2023 වර්ෂයේ දෙසැම්බර් 10 වන දින නිකුත් කරන ලද පොලිස් අත්අඩංගුවේදී හා පොලීසිය සමඟ සිදුවන ගැටුමකදී සිදුවන මරණ පිළිබඳව ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුව සඳහා නිකුත් කළ පොදු මාර්ගෝපදේශ සහ නිර්දේශ හි දක්වා ඇත්තේ,

1.19 අත්අඩංගුවට ගත් වහාම, අත්අඩංගුවට ගත් සැකකරු බලයලත් පොලිස් වාහනයකින් ආරක්ෂිතව අදාළ පොලිස් ස්ථානයට හෝ වෙනත් ගැසට් කරන ලද ස්ථානයකට ගෙන යා යුතු බවයි.

**(3) විමර්ශන වලදී ආරක්ෂාව**

3.2 සියලුම පොලිස් ප්‍රශ්න කිරීම් නිත්‍යානුකූල සහ නිසි ලෙස බලයලත් පැහැදිලිව හඳුනාගත හැකි සහ ප්‍රවේශ වියහැකි ස්ථානයක සිදුකරන බවට පොලිස් නිලධාරීන් සහතික විය යුතු ය.

ඉහත කරුණු අනුව වගඋත්තරකාර පාර්ශවය මෙම සැකකරු තම භාරයේ සිටියදී ප්‍රමාණවත් ආරක්ෂාවක් සැපයීමක් සිදුකර නොමැති අතරම පොලිස් නියෝග ඒ 20, පොලිස්පති චක්‍රලේඛ අංක 2328/2011 සහ පොලිස්පති චක්‍රලේඛ අංක 2747/2023 හි සඳහන් නෛතික ප්‍රතිපාදන නිසි ආකාරව ක්‍රියාත්මක කර නොමැති බව නිරික්ෂණය වේ.

තවද, මෙම වින්දිත තැනැත්තා රාජකාරියේ සිටියදී අත්අඩංගුවට ගත් බව වගඋත්තරකාර පාර්ශවය පිළිගනී. නමුත්, ඔහු අත්අඩංගුවට ගැනීම පිළිබඳව කිසිවෙකු දැනුවත් කර නොමැති බව නිරික්ෂණය වේ. වින්දිතගේ නිවැසියන් ඒ පිළිබඳ සොයාබැලීම් කළ ද ආයතන ප්‍රධානි ඒ පිළිබඳව සොයා බැලිම් කළ ද එදින රාත්‍රී වනතුරු ඔහු පිළිබඳ කිසිදු තොරතුරක් දැනුම් දී නැති බවට කරුණු නිරීක්ෂණය වේ.

දෙපාර්තමේන්තු නියෝග ඒ 20 5.ඕ යටතේ අත්අඩංගුවට ගත් සැකකරුවෙකුට නිවැසියෙකු සමග පණිවිඩ හුවමාරු කරගත හැකි ය. නමුත්, මෙම සිද්ධියේදී එම අත්අඩංගුවට ගැනීම පිළිබඳ ආයතනයට හෝ නිවැසියන්ට දැනුම්දීමක් නොකර වෙනත් තැනක රඳවා ප්‍රශ්න කිරීම තුළ මෙම සැකකරු පිළිබඳ සිතාමතා සැගවීමක් කර ඇති බවට කරුණු නිරීක්ෂණය වේ.

තවද, පොලිස් දෙපාර්තමේන්තු නියෝග 05 ඩී (04) යටතේ ප්‍රවෘත්ති පත්‍රවලට තොරතුරුදීම විභාගයට තිබෙන නඩුවකට හානියක් විය හැකි හෝ පෞද්ගලික ප්‍රචාරයක ස්වභාවය ඇති හෝ තොරතුරු නොදෙන්නට පරිස්සම් වියයුතු බව දක්වා ඇත. තවද, පොලිස්පති නිල කාර්යාලය මගින් 2022.02.14 දිනැතිව නිකුත් කළ RTM 382 මගින් පොලිස් නිලධාරීන් විසින් අත්අඩංගුවට ගත් සැකකරුවන්ගේ තොරතුරු සාමාජ මාධ්‍ය මගින් ප්‍රචාරණය කිරීම යටතේ පොලිස් නිලධාරින් විසින් අත්අඩංගුවට ගන්නා සැකකරුවන්ගේ ඡායාරූප, විඩියෝ දර්ශන හා විමර්ශන තොරතුරු ප්‍රචාරණය නොකළ යුතු බව දක්වා ඇත. මෙම වින්දිත සැබැදිව 01 වන වගඋත්තරකරු හා 09 වන වගඋත්තරකරු කොමිෂන් සභාවේ ප්‍රකාශ කරමින් දක්වා සිටියේ "එම තොරතුරු ලබාදුන් පුද්ගලික ඔත්තුකරුවා සමන්ත විකුණන්නේ පොඩිලැසිගේ බඩු" ලෙස දැන්වූ බව යි. එහෙත් පොලිස් විමර්ශනයේදී පොඩි ලැසිගේ බඩු විකිණීමට වූ බවට කරුණු අනාවරණය විමක් නිරීක්ෂණය නොවේ. කෙසේ වුවද පසුව "පොඩි ලැසිගේ මත්කුඩු ජාවාරමක් සම්බන්ධව" යනුවෙන් දිනමිණ පුවත්පතේ 2023.01.12 දින තොරතුරක් පළවීම තුළ මෙම ලද තොරතුර මාධ්‍ය වෙත නිකුත් කර ඇති බව නිරීක්ෂණය වේ. ඒ අනුව ඒ තුළින් අදාළ දෙපාර්තමේන්තු නියෝග හා පොලිස්පති නිකුත් කළ උපදෙස් ඇතුළත් චක්‍රලේඛ උල්ලංඝණය කර ඇති බවට කරුණු නිරීක්ෂණය වේ. ඒ තුළින් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාවෙන් සහතික කර ඇති නීතියේ ආරක්ෂාව මෙම වින්දිත කෙරේ අහිමිවි ඇති බව නිරීක්ෂණය වේ.

සමස්ථ කරුණු සැලකීමේදි 1 වන, 2 වන, 3 වන, 4 වන, 5 වන, 6 වන, 7 වන සහ 8 වන වගඋත්තරකරුවන් විසින් වින්දිත තැනැත්තා සම්බන්ධව 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11, 12, 13(1) සහ 13(4) ව්‍යවස්ථාවන් මගින් සුරක්ෂිත මූලික අයිතිවාසිකම් උල්ලංඝණය කර ඇති බව නිගමනය කරනු ලැබේ.

**ඒ අනුව පහත සඳහන් නිර්දේශයන් ඉදිරිපත් කර සිටී.**

01. 1 වන වගඋත්තරකරු විසින් රුපියල් ලක්ෂ දහය (රු.1,000,000/-)ක මුදලක් ද, 2 වන, 3 වන, 4 වන, 5 වන, 6 වන, 7 වන සහ 8 වන වගඋත්තරකරුවන් විසින් එක් අයෙකුගෙන් රුපියල් ලක්ෂ දෙක (රු.200,000/-)ක මුදලක් බැගින් ද, 9 වන වගඋත්තරකරු විසින් රුපියල් ලක්ෂයක (රු.100,000/-)ක මුදලක් ද වශයෙන් රුපියල් ලක්ෂ විසිපහ (රු.2,500,000/-)ක මුදලක් පැමිණිලිකාර පාර්ශවය වෙත ගෙවීමට කටයුතු සිදුකළ යුතු ය.

02. 1 වන, 2 වන, 3 වන, 4 වන, 5 වන, 6 වන, 7 වන සහ 8 වන සහ 9 වන වගඋත්තරකරුවන් සම්බන්ධව පරීක්ෂණයක් සිදුකර ඔවුන්ට එරෙහිව සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට පොලිස්පති විසින් කටයුතු කළ යුතුය.

03. ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් පුද්ගලයන් අත්අඩංගුවේ සිටිය දී මියයාම සම්බන්ධයෙන් නිකුත් කර ඇති මාර්ගෝපදේශ මාලාව අනුව පොලිස් නිලධාරීන් කටයුතු කරන්නේ ද යන්න අධීක්ෂණය කිරීම සඳහා සුදුසු නිලධාරියෙකු පත් කිරීමට පොලිස්පතිවරයා විසින් කටයුතු කළ යුතු ය.

04. 1994 අංක 24 දරණ වධහිංසාව වැළැක්වීමේ සම්මුති පනත යටතේ නීති කෘත්‍යයක් ආරම්භ කිරීම සඳහා ඒ පිළිබඳ පරීක්ෂණයක් සිදුකර නීතිපති වෙත යොමු කිරීමට පොලිස්පතිවරයා විසින් කටයුතු කළ යුතු ය.

2025. 08 . 28 දිනට පෙර මෙකී නිර්දේශ ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15(7) වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශ ක්‍රියාත්මක කර ඉදිරිපත් කිරීමට නියමිත දින සිට සතියක කාලයක් තුළ මෙම නිර්දේශ ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකාර පාර්ශවය විසින් ද කොමිෂන් සභාවට දැනුම්දිය යුතු වේ.

එල්.ටී.බී.දෙහිදෙණිය
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු(හිටපු)
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

විනිසුරු එල්.ටී.බී.දෙහිදෙණිය
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

නිමල් ජී.පුංචිහේවා
කොමසාරිස්
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

නිමල් ජී. පුංචිහේවා
ජ්‍යෙෂ්ඨ නීතිඥ
කොමසාරිස්
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

පිටපත් - 01. අමාත්‍යතුමා, මහජන හා සාමය ආරක්ෂක අමාත්‍යාංශය - කරුණු දැනගැනීම සඳහා

02. ලේකම්, මහජන හා සාමය ආරක්ෂක අමාත්‍යාංශය - කරුණු දැනගැනීම සඳහා

03. පොලිස්පති, ශ්‍රී ලංකා පොලීසිය - අදාළ නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා

සැ.යු. - අදාළ මුදල "මුදල් ඇණවුමක්" මගින් පැමිණිලිකාර පාර්ශවය වෙත ගෙවා එහි පිටපතක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන්න.